**යාපනය මහා නගර සභාව - 2023**
**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

යාපනය මහා නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට යාපනය මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ** වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මාගේ වාර්තාවේ 1.6.1 (ඊ)හි නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1** **ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සහ පසුගිය වර්ෂවල සිදුකර තිබූ පිරිවැය රු.67,440,028ක් වූ මූලධන කාර්යයන් 13ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලිවල හිමිකම් ඔප්පු, ලිපිලේඛන නොමැති වීමෙන් ප්‍රාග්ධනිත කර නොතිබූ බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | වැඩ අවසන් නොවූ ඉදිකිරීම් 19කට අදාල රු.82,895,410ක ඇස්තෙමින්තුගත පිරිවැය ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණි. | අදාළ කාර්යයන් මෙම වර්ෂයේ ක්‍රියාත්මක කිරිමට පියවර ගනු ලබන බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සභාව සතු ඉඩම් 23ක සහ වාහන 62ක, වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | තක්සේරු කර ගිණුම්ගත කිරීමට සහ වත්කම්වල පිරිවැය ඉවත් කිරීමටත් කටයුතු කරන බව. | වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | ප්‍රචාරක දැන්වීම් පුවරු 16කින් ලැබිය යුතු හිඟහිටි ගාස්තු රු. 487,500ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2024 වර්ෂයේ ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දේශීය ණය සංවර්ධන ප්‍රදාන වැඩසටහන යටතේ ලබාගෙන තිබූ රු.14,761,961ක් මූල්‍ය ප්‍රකාශනවල සංවර්ධන සංචිත යටතේ ගැලපීම් කර නොදැක්වීමෙන් ආදායම් අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.5,464,800ක යන්ත්‍ර, විදුලි තෙල් ඉසිනයන් 10ක්, පුස්තකාල පොත් 7,341ක් සහ එකතුව රු. 1,041,890කට මිලදී ගත් පුස්තකාල පොත් 2,025ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීමර්**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571(1), (2) හා (3) | වර්ෂ 02ක් ඉක්මවූ කල් ඉකුත් වූ තැන්පතු රු.3,962,259ක් නිරවුල් කර නොතිබුණි. | මෙම වර්ෂයේ නිවැරදි කරන බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.418,843,362ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 333,243,645 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 98,573,826 | 68,896,902 | 87,000,775 | 145,644,642 | 83,307,232 | 103,721,112 | 81,043,388 | 163,748,515 |
| කුලී | 183,340,128 | 100,899,682 | 103,765,019 | 18,811,356 | 363,631,300 | 161,774,184 | 161,752,354 | 21,676,693 |
| බලපත්‍ර ගාස්තු | 28,398,000 | 22,870,236 | 23,083,236 | 185,000 | 25,842,000 | 29,901,290 | 30,322,058 | 398,000 |
| වෙනත් ආදායම් | 378,925,622 | 295,789,760 | 298,451,832 | 8,715,753 | 948,781,442 | 331,904,879 | 227,145,922 | 11,377,825 |
| | **689,237,576** | **488,456,580** | **512,300,862** | **173,356,751** | **1,421,561,974** | **627,301,465** | **500,263,722** | **197,201,033** |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම්**<br>වර්ෂ 01ත් වර්ෂ 05ත් අතර කාලයක් පැරණි රු. 145,644,642ක් වූ හිඟහිටි වරිපනම් ශේෂයක් පැවතිණි. | ආදායම් රැස් කිරීමේ නිලධාරීන් මාර්ගයෙන් සහ ජංගම සේවාවන් මගින් රැස්කිරීමට කටයුතු කර ඇති බව. | හිඟහිටි අදායම් අයකර ගැනීම සඳහා ඵලදායි පියවර ගත යුතුය. |
| (ආ) | **කුලී**<br>සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට කඩකුලී රු.11,094,069ක් සහ වෙළෙඳ පොල බදුකුලී රු.7,719,669ක් හිඟහිටිව පැවැතුණි. ඉන් කඩකුලී රු.47,340ක් සහ බදුකුලී රු.7,719,669ක් වර්ෂ 05කට අධික කාලයක සිට පැවැතුණි. | අයකිරිමට නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | -එම- |
| (ඇ) | **බලපත්‍ර ගාස්තු**<br>විදුලි සංදේශ කුළුණු 06ක බලපත්‍ර ගාස්තු රු.1,955,000ක් අයකර නොතිබුණි. | නීති උපදේශකවරයාගේ වාර්තාව ලැබීමෙන් පසු අය කිරිමට කටයුතු කරන බව. | -එම- |
| (ඈ) | **වෙනත් ආදායම්**<br>සමාලෝචිත වර්ෂ අවසාන දිනට හිඟහිටි ජලගාස්තු ශේෂය රු.1,426,533ක් වූ අතර ඉන් වර්ෂ 05කට අධික කාලයක සිට පැවැත එන රු.364,089ක් පාරිභෝගිකයින් 65ක ගෙන් අයකළ යුතුව පැවැතුණි. | දැනුම් දීමේ ලිපි සහ ජංගම සේවාවන් මගින් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟහිටි අදායම් අයකර ගැනීම සඳහා ඵලදායි පියවර ගත යුතුය. |
| (ඉ) | **උසාවි දඩ මුදල්**<br>පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ මුදල් රු. 5,010,696ක් විය. | මෙම වර්ෂයේ අයකිරිමට කටයුතු කරන බව. | අයකළ යුතු ආදායම් නොපමාව අයකර ගැනීමට පියවර ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ 05කට අධික කාලයක සිට පොදු සංචිත ගිණුමේ නිෂ්කාර්යව පවතින | ඉදිරි සංවර්ධන වැඩපිළිවෙලවල් සඳහා | අරමුදල් නිශ්චිත අරමුණු සඳහා |

| | | | |
|---|---|---|---|
| | රු.373,562,914ක් අදාල අරමුණු සඳහා උපයෝජනය කිරීමට පියවර ගෙන නොතිබුණි. | උපයෝජනය කිරීමට පියවර ගනු ලබන බව. | උපයෝජනය කළ යුතුය. |
| (ආ) | කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී තිබුණු වර්ෂ 05ත් වර්ෂ 27ත් අතර කාලයක් පැරණි රු. 6,883,066 ක අත්තිකාරම් 30ක් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම අය කරගෙන නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව. | අත්තිකාරම් නිරවුල් කරගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ඇ) | කඩකාමර 160ක කුලී ගිවිසුම් වර්ෂ 03 සිට 11කට අධික කාලයක් අළුත් නොකර කුලී අයකරමින් පැවැතුණි. | ගිවිසුම් අළුත්කිරීමට කටයුතු කරමින් පවතින බව. | ගිවිසුම් අළුත්කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | මස්කඩ 12ක්, සුපිරි වෙළෙඳ සැල් 04ක්, වෙළෙඳපොළක් සහ ප්‍රචාරක ගුවන් විදුලි සේවාවක් ආදිය කුලියට ලබා නොදීම හේතුවෙන් රු. 5,487,857ක ආදායමක් අහිමි වී තිබුණි. | ලංසු කැඳවා තිබූ නමුත් කුලියට ලබා ගැනීමට කිසිදු අයෙකු ඉදිරිපත් නොවූ බව. | සුදුසු ක්‍රියාමාර්ග ගෙන කුලියට ලබාදීමට පියවර ගත යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | වර්ෂ 01ත් වර්ෂ 10ත් අතර කාලයක සිට අභාවිතව පවතින වාහන 55ක් අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට හෝ පියවර ගෙන නොතිබුණි. | වාහන වත්කම්වලින් ඉවත් කිරීමටත්, අළුත්වැඩියා කිරීමටත් ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | වත්කම් අභාවිතව නොතැබිය යුතුය. |
| (ආ) | සභාව පරිහරණය කරනු ලබන ඉඩම් 22ක් සහ පරිත්‍යාග ලෙස ලද වාහන 26ක අයිතිය සභාවට පවරා ගෙන නොතිබුණි. | සම්බන්ධිත ලේඛන නොපැවැතීමෙන් හිමිකාරිත්වය ලබාගැනීමට නොහැකිව පවතින බව. | සභාව නමින් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2015 දෙසැම්බර් 30 දිනැති අංක 2016/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 1.1 ඡේදයට අනනුකූලව, සභාවට අයත් නොවූ ඉඩම්වල සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.16,635,383ක් වැය කර වෙළෙඳපොළවල් හා සංස්කෘතික මණ්ඩප ඉදිකර තිබුණි. | සභාවට පවරා ගැනීම සම්බන්ධව ලිපි යවා ඇති බව. | වත්කම්වල අයිතිය නොපමාව නිරවුල් කරගත යුතුය. |
| (ඈ) | ගුරුනගර් වෙළෙඳ පොල සංකීර්ණයේ පිහිටි කඩකාමර 41ක් අළුත්වැඩියා කර භාවිතා කිරීමට පසුගිය වර්ෂ 07ක සිට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කඩ පවත්වාගෙන යාමට සුදුසු පහසුකම් නොමැති වීමෙන් අළුත්වැඩියා නොකළ බව. | වත්කම් අභාවිතව නොතැබිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | නවීන වෛළෙද සංකීර්ණයේ ඉහළ මහලෙහි 2017 වර්ෂයේ ඉදිකර තිබූ ශාලා 02ක් මේ දක්වා උපයෝජනය කර නොතිබුණි. | ලංසු කැඳවූ නමුත් කුලියට ලබාගැනීමට කිසිදු අයෙකු ඉදිරිපත් නොවූ බව. | අදාළ අරමුණු සඳහා උපයෝජනය කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට තනතුරු 46ක පුරප්පාඩු 398ක් පැවැතුණි. | අදාල පාර්ශවයන් වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව. | කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | අනුමත කාර්ය මණ්ඩලයට අමතරව 2014 වර්ෂයේ සෞඛ්‍ය කම්කරුවන් 10ක් සහ සේවිකාවන් 08ක් සභාව විසින් පත්කර තිබුණද, ඊට අවශ්‍ය අනුමැතිය පසුගිය වර්ෂ 09ක කාලය තුළ කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වරයාගෙන් ලැබී නොතිබුණි. | අතිරික්ත කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය ඉල්ලා තිබූ නමුත් මේ දක්වා අනුමැතිය ලැබී නොතිබූ බව. | නීති, රීතිවලට අනුකූලව ප්‍රසස්ත පියවරක් ගත යුතුය. |
| (ඇ) | විශ්‍රාම ගිය, මිය ගිය සහ සේවයෙන් ඉවත්කර තිබූ නිලධාරීන් 163 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 01ත් වර්ෂ 05ත් අතර කාලයක් පැරණි රු. 1,915,467ක් වූ හිඟණය ශේෂය ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | හිඟ ණය ශේෂ නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර තිබූ අයවැය ප්‍රකාරව ඇස්තමේන්තු ගත ආදායම් සහ වියදම් හා තථ්‍ය ආදායම් සහ වියදම් සමග සැසඳීමේදී ආදායම් විෂයන් 05ක සියයට 14 සිට සියයට 51ක් දක්වාත්, වැය විෂයන් 05ක සියයට 17ක සිට සියයට 37ක් දක්වාත් එක් මූලධන වැය විෂයක සියයට 47ක විචලනයක්ද පැවැතිම හේතුවෙන් අයවැය, ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණි. | 2024 වර්ෂයේ සිට ක්‍රියාමාර්ග ගනු ලබන බව. | අවශ්‍යතා හඳුනාගෙන සැලැකිලිමත් ලෙස අයවැය සකස් කළ යුතුය. |

### 4.2 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනත ප්‍රකාරව 2023 වර්ෂය සඳහා ඉලක්ක ස්ථාපිත කර නොතිබුණි. | ඉදිරියේදී සිදුකරන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව පියවර ගත යුතුය. |